# ‘ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව’ විසින් සම්පාදිත වාර්තාව පිළිබඳ මහජන සංවාදය - වාර්තාව



දිනය :
**2016-06-13**

වේලාව :
**ප.ව 2.30**

ස්ථානය :
**විද්වත් වෘත්තිකයන්ගේ සංගම් ශාලාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නය
அரசியலமைப்பு மாற்றத்திற்கான பிரஜைகளின் முயற்சி
Citizens’ Initiative for Constitutional Change

# හැඳින්වීම:

නීතිඥ ලාල් විජේනායක මහතාගේ ප්‍රමුඛත්වයෙන් 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව' දිවයිනේ සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි මහජන අදහස් හා යෝජනා ලබාගත් අතර එම මහජන අදහස් හා යෝජනා සහ කමිටුවේ නිර්දේශ ඇතුළත් වාර්තාව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයට බාර දී තිබුණි.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ කථිකාව ආරම්භයේ සිට ම ඒ ගැන කැපවීමෙන් ක්‍රියා කළ එකමුතුවක් හැටියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නයේ අදහස වූයේ එම කමිටු වාර්තාව පිළිබඳ සංවාදයක් ඇති කළ යුතු බවයි.

ස්ටැන්ලි විජේසුන්දර මාවතේ පිටිහි විද්වත් වෘත්තිකයන්ගේ සංගම් ශාලවේ දී පැවැත් විණි. එම සංවාදය සඳහා පහත නම් සඳහන් විද්වත්හු අදහස් දක් වූහ.

**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**
**නීතිඥ එස්.ජී. පුංචිහේවා**
**මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න**
**කුමුදුනී සැමුවෙල්**
**නීතිඥ එල්මෝ පෙරේරා**
**නීතිඥ ජෝතිලිංගම්**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, නීතිඥ එම්.ඒ.එම් හකීම්**
**අධිනීතිඥ ලාල් විජේනායක**

**නීතිඥ සුදර්ශන ගුණවර්ධන** විසින් සංවාදය මෙහෙය වනු ලැබූ අතර 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුවේ' සාමජිකයින්ද සැමිණ සිටිය හ. ඊට අමතර ව විද්වතුන්, මාධ්‍යවේදීන්, විශ්ව විද්‍යාල සිසුන්, සිවිල් ක්‍රියාකාරකයින් ඇතුළු බොහෝ පිරිසක් මේ සඳහා සහභාගී වූහ. ප්‍රථමයෙන්ම මෙම සංවාදයේ අරමුණ පැහැදිලි කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව ලයනල් ගුරුගේ මහතා අදහස් දක්වූ අතර සංවාදයේ දී ඒ ඒ විද්වතුන් මතු කළ අදහස් පහතින් සැකැවින් දක්වා ඇත.



# ලයනල් ගුරුගේ

මෙම සංවාදයෙහි අරමුණ පැහැදිලි කරමින් ප්‍රථමයෙන් ම අදහස් දක් වූයේ ලයනල් ගරුගේ මහතා ය.  නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳ කථිකාව ආරම්භ වූ මුල් කාලසීමාවේ පටන් සිවිල් සමාජය වශයෙන් 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසකට පුරවැසි ප්‍රයත්නය' ක්‍රියාකාරීව කටයුතු කළ බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව' මහජන අදහස් ලබා ගැනීමට පෙර  පුරවැසි ප්‍රයත්නය වශයෙන් දිවයින පුරා ගොස් මහජනතාව දැනුවත් කරමින් නව ව්‍යවස්ථාව සඳහා අදහස් ලබා ගැනීම වෙනුවෙන් පුරවැසියන් බල ගැන් වූ බවත් ඔහු ප්‍රකාශ කළේ ය. තවදුරටත් අදහස් දක් වූ ගුරුගේ මහතා මෙසේ අදහස් පළ කළේ ය.

මෙම වාර්තාව සඳහා පුරවැසියන් තුන්දහසක් හාරදහසක් අතර පිරිසක් අදහස් ලබා දී තිබුණ ද ජනතාවගේ පුළුල් අදස් ලැබී නොමැත. දකුණු අප්‍රිකාවේ මෙන් ව්‍යවස්ථා සම්පාදනයට පෙර සාධනිය පියවරක් අනුගමනය කරමින් ජනතා අදහස් ලාබ ගැනීමට කටයුතු කළ ද රජය මේ සම්බන්ධයෙන් කළ කැපවීම අවම ය.. එසේ ම රාජ්‍ය මාධ්‍ය හෝ පෞද්ගලික මාධ්‍ය මේ සඳහා ප්‍රචාරණයක් ලබා නොදුන්නා සේම සංවාදයක් ද ඇති නොකළේ ය.

ලාල් විජේනායක මහතා ඇතුළු කමිටු සාමාජිකයන් නොයෙක් ප්‍රශ්න ගැටලු හමුවේ මුහුණ දෙමින්, විවිධ දුෂ්කරා අත් විඳිමින් කෙටි කාලයකින් වාර්තාව සකස් කිරීම පිළිබඳ ප්‍රසංසා කළ යුතු ය.

ජනතා අදහස් හා යෝජනා ලබා ගැනීමෙන් සකස් ව ඇති මෙම කමිටු වාර්තාවට ජනතාවගේ අදහස් අන්තර්ගත ව ඇත් ද යන්න පිළිබඳව සොයා බැලිම ජනතාවගේ වගකීමකි. එසේ ම මේ පිළිබඳ පුළුල් මහජන සංවාදයක් ඇති කිරීම සිවිල් සමාජයේ වගකීමක් වන අතර වඩාත් සාධනීය අයුරින් මෙම නිර්දේශයන් නව ව්‍යවස්ථාවක් සඳහා ලබා ගැනීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බලපෑම් කළ යුතු ය.

එසේ ම මෙම කමිටුව  වාර්තාවේ ඇතැම් ගැටලු සහගත තැන් ද නැතිවා නොවේ. යම් කාරණයක් පිළිබඳව මහජනතාව දක් වූ අදහස් පිළිබඳ සවිස්තර තොරතුරු දක්වීම අත්‍යාවශ්‍ය ය. නිදසුනක් ලෙස, බල බෙදීම, විධායක ජනාධිපති ධුරය සම්බන්ධයෙන් අදහස් දක් වූවානම් ඒ කාරණාවලට පක්‍ෂව කොමණ අදහස් ලැබුණාද, විපක්‍ෂව කොපමණ අදහස් ලැබුණා ද මධ්‍යස්ථාව කොමපණ අදහස් ලැබුණාද වශයෙන් නිශ්චිතව ප්‍රමාණාත්මකව  දක් වීමට තිබුණි. වාර්තාවේ එසේ දක්වා නැත.

ජාතික සංහිඳියා කොමිසම, පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ආදී කාරණා පිළිබඳව වාර්තාවේ සඳහන් නොමැති බවත්, ජනතාව ඒ ගැන යෝජනා ලබාදී නැත් ද නැතිනම් ලබා දුන් යෝජනා ඇතුළත් ව නැද්ද යන කාරණා පිළිබඳව සොයා බැලිය යුතු බවත් ගුරුගේ මහතා වැඩි දුරටත් කියා සිටියේ ය. දිස්ත්‍රික් මට්ටමින් ව්‍යවස්ථාවට යෝජනා ලබා දුන් පුරවැසියන් වෙත ගොස් මේ පිළිබඳ සංවාදයක් ඇති කිරීමේ වැදගත් කම ද ඒ වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අනෙකුත් සිවිල් සංවිදධාන හා එක්ව කටයුතු කරන බව ද ඔහු පැවසුවේ ය.

එසේ දිස්ත්‍රික් මට්ටමින් ඇති කරන සංවාද සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවලට යෝජනා ලබා ගැනීම සඳහා ගිය කමිටු සාමාජිකයින් සහභාගී වීම වැදගත් යුතු අතර කමිටු වාර්තාවේ සාරාංශක් ජනතාවට ලාබා දීමට හැකිනම් එය වැදගත් බව ද පැවසු වේ ය. වඩා යහපත් ව්‍යවස්ථාවක් නිර්මාණය කර ගැනීම වෙනුවෙන් පුළුල් සංවාදයක් ඇති කරමින් මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කටයුතු කළ යුතු බව සඳහන් කරමින් ඔහු අරමුණ පැහැදිලි කිරීමේ කතාව  අවසන් කළේ ය.



# ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු



ප්‍රථමයෙන් ම ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා සංවාදයට අදහස් එක් කළේ ය.

"මෙම කමිටු වාර්තාව නව ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳව සමාජ කතිකාවතකට අපූරු රාමුවක් ලබා දෙනවා. ඒ මන්දයත්, මෙම වාර්තාවේ අන්තර්ගත වන නිර්දේශ අප රටෙහි විවිධ පළාත්වල ජීවත්වන මහජනයාගෙන්ම ලැබුණු අදහස් ය. ඇතැම් කරුණු සම්බන්ධයෙන් කමිටු සාමාජිකයින් සියලු දෙනාට ම පොදු සම්මුතියකට එළැඹීමට නොහැකි වී ඇති වුවත්, නව ව්‍යවස්ථාව සම්පාදනය කරන්නන් හට යා හැකි විවිධ මාවත් මෙම වාර්තාවේ පැහැදිලි කර තිබෙන බව ආචාර්ය සරවනමුත්තු මහතා පැවසුවේ ය.

එතුමා තවදුරටත් පැවසුවේ "මෙම වාර්තාව මා කියවන විට සමහර අපැහැදිලි තැන් හා එකිනෙකට පරස්පර නිර්දේශ හමුවූවත්, වාර්තාව සම්පාදනය කරන විට ඇති වූ විවිධ අභියෝග මට හොඳින් තේරුම් ගතහැකි බවය.

මෙම වාර්තාවෙන් කළ හැකි දේ වන්නේ, ඇතැම් වැදගත් කරුණු පිළිබඳව ආධිවාචනයෙහි (Advocacy) යෙදීම සඳහා මහජනයාට අවකාශය සළසා තිබීමයි. 2015 ජනවාරි දේශපාලන වෙනස ඇති කළ මැතිවරණ ක්‍රියාවලිය තුළ අප රටෙහි ඇති වාර්ගික ගැටලුව පිළිබඳව සාකච්ඡා වූවේ නැහැ. එබැවින් දැන් සිදුවන මෙම ව්‍යවස්ථා වෙනස තුළින් එම ගැටලුවට තිරසාර විසඳුමක් ගෙන ඒමේ වගකීම ආණ්ඩුව සතුයි.

ඒ ආකාරයටම රජයේ ව්‍යුහය පිළිබඳ සංවාදය ද ඉතාම වැදගත් ය. විශේෂයෙන්ම ඒකීය - සන්ධීය රාජ්‍ය පිළිබඳ සාකච්ඡාව අප ඉදිරියෙහි තිබෙන දුෂ්කරම කඩුල්ල ය. තවද බුද්ධ ධර්මයට ප්‍රමුඛ ස්ථානයක් දෙන වගන්තිය ද ඉතාම විවාදාත්මක ය. මෙවැනි කාරණා නව ව්‍යවස්ථාවේ හා නව ශ්‍රී ලංකාවක ආකෘතිය සහ පදනම නිර්වචනය කරයි. රටෙහි උත්තරීතරම නීතිය වන ව්‍යවස්ථාවෙහි කෙතරම් දුරකට ප්‍රජාතන්ත්‍රික මූලධර්ම මත පදනම් වූ වෙනසක් සිදුවෙනවාදැයි සිවිල් සමාජය ලෙස අපි බලා සිටිමු.

ශක්තිමත් ආණ්ඩුවක් තිබේ නම් ස්ථාවර සමාජයක් ගොඩනැගිය හැකි යැයි අප සමාජයේ ජීවත්වන සමහරුන් විශ්වාස කළ ද මෙම මතයෙහි සත්‍යක් ඇති බව මම

විශ්වාස නොකරමි. අප රටෙහි දේශපාලන කැරළි දෙකක් ඇති වූයේ ශක්තිමත් විධායක් ජනාධිපති ක්‍රමයක් පැවති යුගයක වන බව සඳහන් කළ සරවනමුත්තු මහතා විධායක ජනාධිපතික්‍රමය අහෝසි කරනවා නම් විධායක අගමැති ක්‍රමයකට නොයා යුතු යැයි ද කීවේ ය.

'අප සංවරණ හා තුළන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කළ යුතුයි. විශේෂයෙන්ම පාර්ලිමේන්තු කාරක සභා සහ සිවිල් සමාජයටත් මේ සඳහා ලොකු වගකීමක් තිබෙනවා යැයි ද.' තව දුරටත් ව්‍යවස්ථාදායකයට දෙවැනි මණ්ඩලයක් ස්ථාපිත කළ යුතුය යන්න සම්බන්ධයෙන් යම් එකඟතාවයක් ඇති බව පෙනී යන බව ද ආචාර්ය සරවනමුත්තු මහතා පැහැදිලි කළේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය නොවැම්බර් මස අයවැය සාකච්ඡාවට කලියෙන් අවසන් කිරීමට රජයට උවමනාවක් තිබෙන බව පෙනී යයි. යමෙක් සිතන්නට පුළුවන් එය සිදු කළ නොහැකි දෙයක් කියා. එහෙත් මෙම ක්‍රියාවලිය පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීම අපගේ වගකීමයි. ජනමත විචාරනයකින් නව ව්‍යවස්ථාවට ලැබෙන ඡන්දයට වඩා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ ඡන්දය නව ව්‍යවස්ථාවට ලැබේ යන විස්වාසය ආණ්ඩුවට ඇති බව තමන්ට පෙනී යන බව ආචාර්ය සරවනමුත්තු මහතා ප්‍රකාශ කළේ ය.

ජනමත විචාරණයක දී ව්‍යවස්ථා කෙටුම්පත සුළු බහුතරයකින් ජයග්‍රහණය කරගන්නවාට වඩා අතිමහත් බහුතරයක් තුළින් සම්මත කරගැනීමට උත්සාහ කළයුතු බව ඔහු ප්‍රකාශ කළේ ය. ව්‍යවස්ථාවේ සුජාතභාවය ආරක්ෂා කරගත හැක්කේ ඒ අයුරෙන් පමණක් බව ඔහුගේ අදහසයි.






# නීතිඥ එස්.ජී. පුංචිහේවා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුවේ වාර්තා පිළිබඳ අදහස් දැක්වීමේ දී එහි අඩංගු අදහස්, යෝජනා සහ නිර්දේශ එකින් එක කතා කළ යුතු තත්වයක් ඇති බැවින් මෙය යම් අපහසු කාර්යයකි. එහිදී කමිටුව පිළිබඳ ප්‍රාමාණික අදහසක් මහජනයා තුළ ඇති කළ යුතු ය. මන්ද වඩාත් පුළුල් ලෙස විශාල මහජනතාවක් සමගින් මේ සංවාදය ඇති කළ නිසා ය. ලංකාවේ සංස්කෘතිය සහ පුරුද්ද වන්නේ මෙවැනි මහජන කමිටු ඇති කළ ද සම්පූර්ණයෙන් ම මහජනයා අතරට නොයෑමයි. ඒ නිසා සම්පූර්ණයෙන් ම මහජනතාව අතරට යෑමට නොහැකි වන්නට ඇත. ඩොනමෝර් කොමිසම ඇති කළ මුත් එහිද මහජනයාට වඩා 'මහා ජනයා' අදහස් දක් වනු ලැබී ය. 1972 තත්වය ද එසේ ය. මාධ්‍ය ඔස්සේ පමණක් යම් සංවාදයක් ඇති විය. සැබෑ අයුරින් මහජනයා මුණ ගැසුණේ මෑතකදී උගත් පාඩම් කොමිෂන් සභා වාර්තාව සකස් කිරීමේ දී පමණි. එය ද යම් සීමිත කොටසකි. ඉන් පසු අති විශාල ජනතාවක් සමඟ සම්මන්ත්‍රණය කරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව යි. මෙවර ද සම්පූර්ණ ජනතාව අතර යෑම සඳහා ඉඩ නොලැබීමට යම් යම් හේතු තිබෙන්නට පුළුවන. ලංකාවේ සංස්කෘතිය අනුව පහළ ජනතාවගේ අදහස් ලබා ගැනීමට යෑමට අවස්ථාව නොදෙන අතර බිම් මට්ටමේ ජනතාවගේ අදහස් ලබා ගැනීමට කැමැත්තක් ද නොමැත. එවැනි තත්වයකදී කෙසේ හෝ සෑම ප්‍රදේශකට ගොස් ඉතා ම පුළුල් කාරණාවක් ගැන පුළුල් සාකච්ඡාවක් කිරීම කොමිසම විසින් සිදු කරන ලද වැදගත් කාර්යයකි.

මහජන අදහස් විමසීමේ කොමිසම සහ එහි ඉතිහාසය පිළිබඳ යම් අදහසක් දැකවූ පුංචිහේවා මහතා තවදුරටත් පැවසුවේ කොමිසමේ අදහස්වලට වඩා මහජනයාගේ අදහස්වලට ඉඩදී ඇති බවත්, අන් කොමිසම්වලට වඩා මෙය පුළුල් කොමිසමක් බැවින් හැම යෝජනාවකට ම එකඟ වීමට ද නොහැකි වී ඇති බවත් ය. එසේ ම මෙහි අති සියලු යෝජනා ගන්නේ නම් දකුණු අප්‍රිකාව සහ කෙන්යාවේ ව්‍යවස්ථා තරමට ම සාර්ථක ව්‍යවස්ථාවක් මෙරටේ තැනිය හැකි බවත් එසේ සිදු වේවිද යන ප්‍රශ්න ඇති බවත් පැවසූ එස්.ජී මහතා මෙය මජනතාවට ඉදිරිපත් කළ වාර්තාවක් ලෙස සළකා මෙහි යෝජනා ව්‍යවස්ථාවට නොගන්නේ නම් ඒ පිළිබඳ ප්‍රශ්න කළ යුතු බව අවධාරණය කළේ ය.

වාර්තාව දීර්ඝ එකක් බැවින් එහි ස්ථාන කීපයකින් ගත් කරුණු පිළිබඳ ඔහු සාකච්ඡා කළේ ය.

- බලතල බෙදීම

නිර්දේශය "බලතල බෙදීම පිළිබඳ සිද්ධාන්තය, හුදු අර්ථය නොව, එහි අගය හා ජීව ගුණය සලකා ව්‍යවස්ථා සම්පාදනයේ දී අවධානය යොමු කළ යුතුවේ.

- පළාත් පාලනය

පවතින මහ නගර සභා, නගර සභා, ප්‍රා.සභා වලට අමතරව ගම් මට්ටමේ ග්‍රාමීය ජන සභාවක් පිහිටුවීම, පළාත් පාලන ආයතන වල කටයුතු වලදී උපදේශක හා අධීක්ෂණ කාර්යක් සඳහා ග්‍රාමීය ජන සභාවලට බලය තිබිය යුතුය.

වතුවල මානව ජනාවාස ගම් පද්ධතියේ කොටසක් ලෙස ප්‍රකාශ කර ගම් සභා, සුළු නගර සභා නාගරික සභා හා මහනගර සභාවල කොටසක් කිරීම නිර්දේශ කෙරේ.

- නියාමක මූලධර්ම

වෙළඳපොළ හා රාජ්‍ය පද්ධති වලට විකල්පයක් ලෙස සමූපකාර ක්‍රමය රජය පිළිගත යුතු අතර සමූපකාර ව්‍යාපාරය ප්‍රචලිත කිරීමට කටයුතු කරමින් ඊට දේශපාලන මැදිහත්වීම වැළැක්විය යුතුය.

වැඩ පොළේ මූලික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්ති වල සඳහන් කම්කරු අයිතිවාසිකම් රජය ආරක්ෂා කළ යුතුය.



- රජය අත්සන් කළ ජාත්‍යන්තර ප්‍රඥප්ති ; සම්මුති හා ගිවිසුම් ඒවා අත්සන් කිරීමෙන් අවුරුද්දක් ඇතුළත නීතිගත කිරීමට සහතික වීම රාජ්‍යයේ වගකීම වෙයි.

  මෙම පරිච්ඡේදයේ අඩංගු ප්‍රතිපාදන කිසිම උසාවියක හෝ අධිකරණයක බලාත්මක කළ හැකි නොවේ.

කමිටු වාර්තාවේ සඳහන් ඉහත කාරණා සම්බන්දයෙන් පැහැදිලි කිරීමක් කළ පුංචිහේවා මහතා මීට අමතරව එහි සඳහන් මූලික අයිතිවාසිනම් පිළබඳ පහත කාරණා පිළිබඳව ද අදහස් දැක්වී ය.

- මූලික අයිතිවාසිකම්
  - ජීවිතයට ඇති අයිතිය
  - සමානාත්මතා නීතියට අමතරව - අසමාන ලෙස සැලකීම පිටු දැකීමේ කොමිසමක් පත් කළ යුතුය.
  - කමිටු වාර්තාවේ නිර්දේශ පවතින ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාවට වඩා පුළුල්ය.
  - "ජාතිය, ආගම, කුලය, වෛවාහක තත්වය, මාතෘභාවය, වයස, භාෂාව, කායික හෝ මානසික දුබලතාව, ගැබිනි බව, සිවිල් තත්වය, වැන්දඹු වීම, සමාජ සම්භවය, ලිංගිකත්ව නැඹුරුව, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය - වෙනස් ලෙස නොසැලකිය යුතුය.
- පුද්ගලයකුගේ අයිතිවාසිකමක් හෝ මූලික නිදහසක් කෙරෙහි පරිපාලන ක්‍රියාවක් නිසා අහිතකර බලපෑමක් ඇති වේ නම්. එම ක්‍රියාව සඳහා හේතු ලිඛිතව ලබා ගැනීම එම පුද්ගලයාට අයිතියක් තිබේ.
- සෞඛ්‍යයට ඇති අයිතිය
  - ආහාර, ජලය හා සමාජ ආරක්ෂාව
  - ආහාර සුරක්ෂිතතාව, ආහාර ස්වාධීනත්වය
  - ප්‍රමාණවත් ආහාර, ජලය, ඇඳුම් හා නිවාස
  - කුසගින්නෙන් තොරව සිටීමේ අයිතිය සමාජ ආරක්ෂාව - සමාජ රක්ෂණය
- අධ්‍යාපන අයිතිය
- ඉඩම් අයිතිය
- පරිසරය ආරක්ෂා කිරීම
- වැඩ කිරීමට, රැකියාවට හා ජීවනෝපායට අයිතිය

- වෘත්තීය සමිති අයිතිවාසිකම්
- ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් විදේශීය ආයෝජකයන් දේශීය නීති නොතැකීම
- කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු අයිතිවාසිකම් රැකීමේ දී අසාර්ථක බව
- දේපළ හා ඉඩම් අයිතිය
- සෑම පුද්ගලයකුටම, භාවිතය, මාරු කිරීම, පරිපාලනය, පාලනය, අයිතිය අත්පත් කර ගැනීම, කළමනාකරණය, බුක්තිය, පැවරීම, උරුමය - සම්බන්ධ සමාන අයිතිවාසිකම් තිබිය යුතුය.
- උසාවියෙන් ලබාගත් නියෝගයක් මත නීතියෙන් ඉඩදී ඇති ආකාරයට හැර කිසිම පුද්ගලයකුගේ නිවසක් කඩා බිඳ නොදැමිය යුතුය. නිවසෙන් ඉවත් නොකළ යුතුය.
- රාජ්‍ය රැකියාවල සාධාරණත්වය හා සමාන අවස්ථා
- අතුරුදහන් නොවීමේ අයිතිය
- තොරතුරු ලබා ගැනීම
- යුක්තිය සඳහා අයිතිය
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම්
- පාරිභෝගික අයිතිවාසිකම්
- තිරසාර සංවර්ධනය හා ශුභසාධනයට අයිතිය
- විවිධ ලිංගික අනන්‍යතා සහිත ජනයාගේ අයිතිවාසිකම්

➢ නිර්දේශ

- අධිකරණ ක්‍රියාදාමයකින් මූලික අයිතිවාසිකම් කඩවූ අවස්ථාවකදී අධිකරණය ද වගකීමට යටත් විය යුතුය.
- පුද්ගලික ආයතන විසින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළ විට එය අධිකරණයේ අභියෝග කළ හැකි විය යුතුය.
- මූලික අයිතිවාසිකම් නඩු පැවරීමට ඕනෑම පුද්ගලයකුට හෝ කණ්ඩායමකට හැකි විය යුතුය.
- නිර්දේශ මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ඉදිරිපත් කිරීමට කාල සීමා මාස තුනක් දක්වා දීර්ඝ කළ යුතුය.
- උචිත අවස්ථාවන්හි අවිධිමත් අයදුම්පතක් හෝ පිළිගත යුතුය.

ඉහත සඳහන් අයුරින් මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් කමිටු වාර්තාවේ සඳහන් යෝජනා හා නිර්දේශ පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කළ පුංචිහේවා මහතා එම නිර්දේශ නව ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමේ වැදගත්කම පිළිබඳව සඳහන් කළේ ය. එසේ ඇතුළත් නොවන්නේ නම් පුරවැසියා ඒ වෙනුවෙන් පෙනී සිටිය යුතු බව ද අවධාරණය කළේ ය.



# කුමුදුනී සැමුවෙල්

සංවාදයට සහාගී වූ විද්වතුන් අතර එකම කාන්තා නියෝජනය වූ කුමුදනී සැමුවෙල් මහත්මිය කියා සිටියේ කාන්තා සංවිධාන බොහෝමයක් සමඟ එක් ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුවට අදහස් හා යෝජනා ලබා දී ඇති බවත් ඒවා මෙම අදහස් දැක්වීමේ දී බෙදා හදා ගන්නා බවත් ය. ඒ අනුව ව්‍යවස්ථාවට කාන්තා අදහස් ලබා ගැනීම සඳහා ලංකාවේ බොහෝ ප්‍රදේශවල ගොස් ඔවුන් දැනුවත් කළ බවත් ඒ අවස්ථාවලදී බොහෝ කාන්තාවන් ඒ පිළිබඳව අවබෝධයක් නැති බව පැවසූ බවත් සඳහන් කළේ ය.

සැමුවෙල් මහත්මිය වැඩිදුරටත් මෙසේ ප්‍රාකාශ කළා ය.

රාජ්‍ය ප්‍රජාතන්ත්‍රිකරණය තහවුරු කිරීම, නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කිරීම සහ බලය බෙදාහැරීම සම්බන්ධයෙන් දේශපාල විසඳුම කුමක් ද යන්න පිළිබඳ කාන්තා සංවිධාන සමඟ සාකච්ඡා කරමින් ඒ පිළබඳව අදහස් ඉදිරිපත් කළේ ය. අපට විශේෂ ප්‍රශ්නයක් ව තිබුණේ නීති විමර්ශනය පිළිබඳ ව ය. නොයෙකුත් වෙනස්කොට සැලකීම් කාන්තාවන් හැටියට අප අත් විඳින අතර එම නීති විමර්ශනය කිරීම නැවතත් ව්‍යවස්ථාවට ඇතුළත් විය යුතු යැයි අප අදහස් ඉදිරිපත් කළෙමු. තව ද ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් සුරක්ෂිතභාවය, නිදහස, වගකීම සහ වගවීම යන යහපාලනයට අදාළ දේවල් අප සාකච්ඡා කළ අතර කාන්තාවන් හැටියට මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට සමාජ ආර්ථික අයිතීන් පිළිබඳව ද කරුණු ඇතුළත් විය යුතුයැයි නිර්දේශ ඉදිරිපත් කළෙමු.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට ඉතිහාසයේ සිදු නොවූ විදියට සියලු අයිතිවාසිකම් ඇතුළත් වන පරිදි කරුණු ඇතුළත් කර තිබීම සම්බන්ධයෙන් කුමුදුනී මහත්මිය ප්‍රශංසාව පළ කළා ය. එසේ ම කාන්තා අයිතීන් සුරැකෙන අයුරින් ද කරුණු ඉදිරිපත් කර ඇති බව ඇය සඳහන් කළා ය.

එසේ ම දේශපාලන සහභාගීත්වය පිළබඳව පළාත් පාලන අයතනවල සිට පාර්ලිමේනතුවටත්, ගම් සභා ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ සිටම ජනතා සහභාගීත්වය තහවුරු කර ගන්නේ කෙසේ ද, විශේෂයෙවන් ම කාන්තාවන් දේශපාලනයටය යොමු කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කළ බව ඇය සඳහන් කළා ය.

නව ඡන්ද ක්‍රමයක් ඇති වන්නේ නම් එහි කාන්තා නියෝජනය සිදුවන්නේ කෙසේ ද යන්න පිළිබඳ කමිටු නිර්දේශවල කරුණු ඇතුළත් වන බවත් එය කාලයක් තිස්සේ කාන්තා සංවිධානගෙන ගිය අරගලයක ප්‍රතිඵලයක් බවත් ඇය අවධාරණය කළා ය.

ව්‍යවස්ථාවේ 13 වගන්තිය, ස්වාධීන කොමිෂන් සභා, ස්වාධීන කාන්තා කොමිෂන් සභාවක් පිහිටුවීම සම්බන්ධයෙන් ද ඉදිරිපත් කළ අදහස් කමිටු වාර්තාවට ගෙන ඇති බව ඈ සඳහන් කළා ය.

මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාවේ වඩාත් සාධනීය නිර්දේශ ඇති නිසා ඒ ඔස්සේ ජනතා නියෝජිතයින් සහ මහජනතාව දැනුවත් කළ හැකි බවත්, එසේ ම විකල්ප අදහස් ද ඇති නිසා ඒ ඔස්සේ වඩාත් ප්‍රගතිශීලී නිර්දේශ තීරණය කිරීමට සංවාදයක් ගොඩ නැගිය යුතු බව කුමුදුනී මහත් මිය කියා සිටියා ය. පුද්ගලික නීති සම්බන්ධයෙන් ද, සමානාත්මතාවය සහ වෙනස්කොට සැලකීම සම්බන්ධයෙන් ඇති නීති පද්ධති වෙනස් විය යුතු බව ද ඒ පිළිබඳ පොදු සංවාදයක් ඇති විය යුතු බවද ඇය සඳහන් කළා ය.

අවසන් වශයෙන් ඇය සඳහන් කළේ කමිටු වාර්තාවේ සඳහන් අනුමත කළ හැකි සාධනීය නිර්දේශ දේශපාලන කථිකාවක් දක්වා වර්ධනය කළ යුතු බවයි. එසේ ම ඒ පිළිබඳ මාධ්‍ය සහභාගී කරගනිමින් පවතින ආණ්ඩුව මහජන සංවාදයක් ඇති කළ යුතු බවත් එසේ නොවන්නේ නම් සිවිල් සමාජය මේ සම්බන්ධයෙන් මූලිකත්වය ගෙන කටයුතු කළ යුතු බවත් ඇය දැඩිව අවධාරණය කළා ය.





# මහාචාර්ය ජයන්ත සෙනෙවිරත්න

දිවයින පුරා අන්තර් ආගමික දංවිධාන බොහෝමයක් සමඟ තමා වැඩ කරන බවත් එම සංවිධානවලට නව ව්‍යවස්ථාව සඳහා අදහස් ලබා දීමට ලාල් විජේනායක මහතා අවස්ථාව ලබා දුන් බවත් පැවසූ ජයන්ත සෙනෙවිරත්න මහතා කමිටුවේ සභාපති ඇතුළු කාර්ය මණ්ඩලයට කෘතඥතාව පළ කළේ ය.

1991 දී දකුණු අප්‍රිකාව ව්‍යවස්ථාව නිර්මාණය සඳහා Convention for a Democratic south Africa යන ෆෝරමය නිර්මාණය කළ බවත් ඒ ආකාරයට ම ලංකාවේ ව්‍යවස්ථාව සඳහා අදහස් ලබා ගත් බවත් පැවසී ය. වෙනසකට ඇත්තේ ලංකාවේ මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාවේ නිර්දේශ එකඟතාවයකින් තොරව වෙන වෙන ම ඇතුළත් කිරීමත් දකුණු අප්‍රිකාවේ එසේ නොවී ව්‍යවස්ථාව සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණ නිර්දේශ ඉදිරිපත් කර තිබීමත් බව ඔහු සඳහන් කළේ ය.



මහාචාර්යවරයා මූලික වශයෙන් කාරණා දෙකක් පිළිබඳව අවධාරණය කළේ ය.

ලංකාවේ සමගි සන්ධාන ක්‍රියාවලිය සඳහා ශක්තිමත් එක් ආයතනයක් ස්ථාපිත කළ යුතු බව ඔහුගේ පළමු අදහස විය. මන්ද විශාල ලේ හැලීම්වලින් අනතුරුව නව ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමට අවස්ථාව හිමිව ඇති බවත්, එය සැහැල්ලුවෙන් සැලකිය නොහැකි බවත් එම නිසා සමගි සන්ධාන ක්‍රියාවලිය ට ප්‍රමුඛත්වයක් ලබා දිය යුතු බවත් සෙනෙවිරත්න මහතාගේ අදහසයි. සමගි සන්ධාන ක්‍රියාවලිය සඳහා රනිල් වික්‍රමසිංහය අගමැති යටතේ එක් ආයතනයක් ද, චන්ද්‍රිකා බණ්ඩාරනායක හිටපු

ජනපතනියි යටතේ එක් ආයතනයක් ද, ඇමති මනෝ ගනේෂන් යටතේ එක් ආයතනයක් ද රාජ්‍ය ඇමති ෆවුසි යටතේ තවත් ආයතනයක් තිබීම ඔස්සේ එකී අයාතන විසිර තිබීම නිසා මේ කාර්යය නිසි ලෙස කළ නොහැකි බවත් ඒ සඳහා ඉතාමත් ශකතිමත් එක් ආයතනයක් පිහිට විය යුතු බවත් සඳහන් කළේ ය. එසේ ම ප්‍රතිපාදන නොමැති කමද ගැටලුවක් නිසා මෙම කාර්යන් සඳහා ප්‍රතිපාදන වෙන් කළ යුතු බවද අවධාරණය කළේ ය.

ආරක්ෂ හමුදා ප්‍රතිසංස්කරණය කිරීම ද කාලීන අවශ්‍යතාවක් බවත් රෙජිමේන්තු නාම, කාර්යය භාර්යය සංයුතිය ආදිය වෙනස් කළ යුතු බවත් දකුණු අප්‍රිකානු නිදසුන් සහිතව සඳහන් කළේ ය. දකුණු අප්‍රිකාවේ South African Defense Force ලෙස තිබූ හමුදාව South African National Defense Force වශයෙන් වෙනස් වූ බවත් ඒ ඔස්සේ කළු ජාතීන්ට ද අවස්ථාව ලබා දුන් බවත් ඔහු සඳහන් කළේ ය. කළු ජාතිකයින් ආරක්ෂක හමුදාවට බඳවා ගැනීම, ගෝත්‍රික ජනතාව හමුදාවට බදවා ගැනීම සිදු වූ බවත් ගෝතමාලාව වැනි රටවල ද එය ක්‍රියාත්මක වූ බවත් වැඩි දුරටත් පැවසුවේ ය. එම නිසා ලංකාවේ ද එය කළ යුතු බව ඔහුගේ අදහසයි.





# නීතිඥ සී.ඒ. ජෝතිලිංගම්

බලය බෙදීම සහ දෙමළ ජනතාවගේ අභිලාෂයන් කමිටු වාර්තාවේ අන්තර්ගතව ඇත්ත යන කාරනය පිළිබඳව සැලකිලිමත් වෙමින් ජෝතිලිංගම් මහතා අදහස් දක් වූ අතර ඔහු දක්වූ අදහස් පහත පරිදිවේ.

මෙම වාර්තාව පිළිබඳව මා දරන්නේ වෙනස් මතයකි. මෙම වාර්තාව පිළිබඳව දමිළ සමාජයේ අදහස් නියෝජනය කිරීම අපගේ අපේක්ෂාව වේ. මෙම අදහස් විමසීමේ කමිටුව දමිළ ජනතාවගේ අභිලාෂයන් නිවැරදිව හඳුණාගෙන සිටියා ද ? මෙම යෝජනාවලියේ නිර්දේශ දමිළ ජනතාවගේ අභිලාෂයන් හට කොතරම් සාධාරණයක් ඉටුකර තිබේ දැයි යන පදනමින් මාගේ අදහස ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙමි.

ජාතික අරගල යනු කුමක් ද? දෙමළ ජනතාව ජාතික ජන කොට්ඨාසයක් ලෙස සහ දේශයක් යන පදනමින් ජීවත් වේ. එම ජාතික ජන සමාජය විනාශ කිරීම ජාතික අරගල නම් වේ. එම ජන කොට්ඨාසවල පදනම වන්නේ භාෂාව, ඉඩම්, ආර්ථිකය, සංස්කෘතිය, සහ ජන සමූහය යන කාරණා ය. මේවා එම ජන සමාජයට දරා සිටීමේ ප්‍රධාන කුලුණු වේ. එම කුලුණු විනාශ කිරීම ජාතික අරගලයෙන් සිදු වේ. නමුත් විය යුත්තේ එම කුලුණු ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙලකි. මෙම ගැටලුවට විසඳුමක් ලෙස මා දකින්නේ, දෙමළ ජන කොට්ඨාසය ජාතියක් ලෙස පිළිගත යුතු ය යන්නයි. එසේ දෙමළ ජනයා ද ජාතියක් ලෙස පිළිගත්තා නම් ලංකාවේ ආණ්ඩුකරණය වෙනස් විය හැකි ය. ලංකා රාජ්‍යය, බෞද්ධ රාජ්‍යයක් හැටියට කමැත්තෙන් හෝ අකමැත්තන් පිළි ගැනීමට සිදුව තිබේ. මෙම තත්ත්වය වෙනස් වී ලංකාව බහු වාර්ගික රාජ්‍යයක් හැටියට ගොඩ නැගිය යුතු ය. එහිදී ඒකීය ක්‍රමය වෙනස් වී ෆෙඩරල් ක්‍රමයක් ඇති විය යුතු ය. මෙවැනි ආණ්ඩුකරණය තුළ දෙමළ ජනතාව කරුණු කීපයක් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.


බලය යන්න ඉන් ප්‍රමුඛ ය. දෙමළ ජනතාවගේ වාසස්ථාන, අයිතීන්, අනන්‍යතාවය, වැනි දෑ ආරක්ෂාකර ගන්නට උතුරු නැගෙනහිර ඒකාබද්ධ කිරීම අනිවාර්ය ය. එම එකමුතුව කිසිසේත්ම අත්හැර දැමීමට දෙමළ ජනතාව කැමති නොවෙයි. මෙහිදී මුස්ලිම් ජනතාව මෙම බල ප්‍රදේශයේ සිටීමට ඇකමැති නම් ඒ ගැන වෙනම ම ඔවුන් සමඟ සාකච්ඡා කළ යුතු ය. එසේ එකතුවීමට අකමැතිනම් මුස්ලිම් ජනතාවට ඔවුන් කැමති පරිදි සිටින්නට දී දෙමළ ජනතාව බහුලව ජීවත්වන ප්‍රදේශය උතුරු නැගෙනහිරට ඒකාබද්ධ කළ යුතු ය.

දෙමළ ජනතාවට ස්වයං පාලන අයිතියක් ලබා දිය යුතු ය. මෙම ස්වයංපාලනය කරුණු දෙකක් කෙරෙහි වැදගත් වේ. පළමු වැන්න නම්, ජාතික ජන සමාජයක් ලෙස පිළිගැනීම නිසා එය එසේ විය යුතු ය. දෙවැන්න පසුගිය යුද සමයෙන් පසු දෙමළ ජනතාව නැවත ගොඩ නැගීමට නම් එම බලය ඔවුන්ට ලබා දිය යුතු ය. අපට ජාත්‍යන්තර වශයෙන් බොහෝ අත්දැකීම් තිබේ. බලය බෙදීම යන කාරණයේ දී ස්විස්ටර්ලන්තය, කැනඩාව, බෙල්ජියම යන රටවල අත්දැකීම් අපට ගත හැකි ය.

මධ්‍යම රජය දෙමළ ජනතාවට ජාතියක් ලෙස අවකාශ ලබා දිය යුතු ය. මධ්‍යම රජය සිංහල බෞද්ධ රාජ්‍යක් ලෙස තබා ගනිමින් කොපමණ බලය බෙදීමක් සිදු කළ ද ඉන් ඵලක් නොවේ. මෙය ඉතිහාසයේ අපි ලබපු අත්දැකීමකි. ඒ නිසා මධ්‍යම රජයේ ස්වභාවය බහුවිධ රජයක් බවට පරිවර්තනය විය යුතුය. බලතල ආරක්ෂාකර ගැනීම පිළබඳ ව අපට අත්දැකීම් ඇත. 'එක් අතකින් දී අනික් අතින් ගන්නා' ක්‍රියා පටිපාටියකි, එදා සිට අද දක්වා ඇත්තේ. මෙම ක්‍රමය වෙනස් වන්නට නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම ඒ පිළබඳ තහවුරු කළ යුතු ය. එසේ ම ද්විතීයික ඡන්ද ක්‍රමය ඇති කළ යුතු ය.

ඉහත කාරණා දෙස බලන විට මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාවේ මෙම අදහස් නොතිබීම කනගාටුවට කරුණකි. දෙමළ ජනතාවගේ අභිලාෂයන් යම් ප්‍රමාණයකින් හෝ මෙම වාර්තාවේ සඳහන් වී නොමැත. දෙමළ ජනතාව ජාතික ජන සමාජයක් බවට පත්විය යුතුයි වැනි කිසිදු වාක්‍යයක් නොමැත. මධ්‍යම රජය බහුවිධ විය යුතු වැනි අදහසක් මෙහි නොමැත. ඒකීය රජය කියන ක්‍රමය දිගින් දිගටම පවත්වා ගැනීමට යන අයුරු පෙනේ. මෙය ඉතා ගැටලු කාරී ය. බලය බෙදීම යන කාරණයේ දී උතුරු නැගෙනහිර ඒකාබද්ධ නොවිය යුතුය යන මතයයි බහුතර ජනතාවකට ඇත්තේ. පරමාධිපත්‍ය බලය හැටියට බැලුව ද උතුරු නැගෙනහිර එක් කිරීම හෝ වෙන් කිරීම එම ජනතාවගේ අයිතියකි. තවද ස්වයං පාලන බලය දෙමළ ජනතාවට ලබා දී නැත. සන්ධීය අයිතිය, සන්දධීය බලය යන අදහස් මෙහි සඳහන් වී නොමැත. ඒ නිසා මේ සියලු ම දේම අන්තර්ගත වන්නේ නම් එය අංගසම්පූර්ණ වාර්තාවක් වනු ඇත.

# නීතිඥ එල්මෝ පෙරේරා



ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීම "ඉතාම බාරධූර කාර්යයක් එය **කොතරම් බාරධූරයැ**
පවසනවනම් එම ක්‍රියාවලියට දේශපාලඥයින් පමණක් සම්බන්ධ වීම ප්‍රමාණවත් නැත." මේ අයුරින් ජනතාව සහභාගී කර ගැනීමේ වැදගත් කම අවධාරණය කරමින් නීතිඥ එල්මෝ පෙරේරා තම අදහස් දක්වීමට මුළ පිරුවේය. කමිටු වාර්තාවේ ඇතැම් කරුණු කෙරෙහි එම කමිටුවේ සාමාජිකයන්ගේ පොදු ස්ථාවරයක් නොමැති වීම යහපත් දෙයක් විය හැකි බව ද එවිට එවැනි වැදගත් කරුණු පිළිබඳව මහජනයාට වඩ වඩාත් විශ්ලේෂණාතමකව සාකච්ඡා කළ හැකි  බව ද සඳහන් කළේ ය.

"අප මෙම අවස්ථාවට ළඟා වී ඇත්තේ මෙරට සියලුම ජනවර්ග වල වැසියන්ගේ රුධිරය මතින් බවත් එනිසා ජාතික ප්‍රශ්නයට තිරසාර විසඳුමක් මෙම ක්‍රියාවලිය තුළින් සෙවීම ඉතාමත් ම වැදගත් බව නීතිඥ පෙරේරා මහතා පැවසුවේ.

මාදුළුවාවේ සෝභිත හිමියන්ගේ නායකත්වයෙන් සාධාරණ සමාජයක් උදෙසා ජාතික ව්‍යාපාරයේ මතය අදටත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළයුතුය යන්න ය. කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු 25-30 ත් අතර ප්‍රමාණයකට සීමා වීම, ද්වි මණ්ඩල ව්‍යවස්ථාදායක ක්‍රමය ආදී අදහස් ද ඉතාම වැදගත් බව පෙරේරා මහතා පැවසුවේ ය. වාර්තාවේ ඇතැම් කරුණුවලට එකඟ වෙමින් එකී කරුණු විශ්ලේෂණය කළ පෙරේරා මහතා, ජාතික කොඩිය, ජාතික ගීය, ආගම වැනි කාරණාවලට පහසු විසඳුමක් නොමැති අතර එයට විසඳුමක් සෙවීමේ දී රටේ සියලු ජනතාව ගැන සිතමින් තීරණයකට ආ යුතු බව සඳහන් කළේ ය. ව්‍යවස්ථාව රටෙහි උත්තරීතරම නීතිය විය යුතු යැයි කමිටු වාර්තාවේ සඳහන් අතර එයට තමා එකග වන බවත් ව්‍යවස්ථාව අර්ථකතනය කළ හැකි එකම ව්‍යුහය අධිකරණය පමණක් බවත් ඒ සඳහා අධිකරණය ස්වාධීන වියයුතු බවත් සඳහන් කළේ ය. තව ද, වාර්තමානයේ එවැනි ස්වාධීන අධිකරණයක් නොමැති අතර ව්‍යවස්ථාව නිසි පරිදි සම්පාදනය වුව හොත් ස්වාධීන අධිකරණයකට ඉබේම මගපෑදෙන බව ඔහුගේ අදහස ය.

පළාත් වලට අවශ්‍යනම් ජනමත විචාරණයක් තුළින් ඒකාබද්ධවිය හැකි බව වාර්තාවේ දක්වා ඇති අතර එසේ ඒකාබද්ධ වුව හොත් ඒ පළාත්වල සිටින සුළුතර ජනතාවගේ නියෝජනය පිළිබඳ සොයා බලා කටයුතු කළ යුතු යැයි තමා විශ්වාස කරන බව පෙරේරා මහතා පැවසුවේ ය. ජනතාවට පාලනයට එකතුවීම සඳහා ක්‍රමවේදයක් නොමැති බැවින් කමිටු වාර්තාවේ සඳහන් ග්‍රාම රාජ්‍ය සංකල්පය වඩාත් සාධනීය බවත් ඔහු සඳහන් කළේ ය. එය බිම් මට්ටමේ ජනතාව සමඟ එකතුව ක්‍රියාත්මක වන ව්‍යුහයක් විය යුතු අතර ආණ්ඩුවට අවශ්‍ය නම් ඉන්දියාවේ පංචායත් ක්‍රමය පිළිබඳ අදහසක් මේ සඳහා ලබා ගත හැකි බවද සඳහන් කළේ ය.

දින කිහිපයකට පෙර මියගිය, ග්‍රාම රාජ්‍ය සංකල්පය පිළිබඳ සංවාදයේ ලංකාවේ පුරෝගාමියෙකු වූ යූ.බී. විජේකෝන් මහතා සිහි කරමින් පෙරේරා මහතා තම අදහස් දක්වීම අවසන් කළේය.

# ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, නීතිඥ එම්.ඒ.එම් හකීම්



එම්.ඒ.එම් හකීම් මහතා මූලික වශයෙන් කමිටු වාර්තාවේ අන්තර්ගත කාරණා පිළිබඳව අවධානය යොමු කර ඇති අතර ඔහු එකී කාරණා එකින් එක විග්‍රහ කරමින් කරුණු ඉදිරිපත් කළේ ය. ඔහු දැක්වූ දහස් පහතින් සැකවින් දක්වා ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවලට ගොස් ජනතා යෝජනා හා අදහස් අරගෙන වාර්තාවක් සමාජගත කොට තිබේ. මෙවැනි ක්‍රියාවලියක් ලංකා ඉතිහාසයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නිර්මාණය කිරීමේ ක්‍රියාවලියේ දී සිදු වූ ප්‍රථම අවස්ථාව ලෙස පෙන්වා දිය හැකි ය. මේ කමිටුවේ බුද්ධිමතුන් 20 දෙනෙකු එකතුව කාරණා 20 පිළිබඳ කෙටි කාලයකදී සමාජගත කළ වාර්තාවකි.

විශේෂයෙන් ම ලංකාවේ ජාතික ගැටලුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් ස්ථිර විසඳුමක් ලැබේ යැයි සිතීම බහුතර ජනතාවකගේ බලාපොරොත්තුවකි. මෙහිදී විධායක බලතල ඇතුළු ජනාධිපති ක්‍රමය, ඡන්ද ක්‍රමයව, ආගම, බලය බෙදීම යන කාරණා පිළිබඳ ව කමිටු වාර්තාවේදී සාකච්ඡා කර තිබෙන බව පෙනේ. මෙවැනි කාරාණා දෙආකාරයකට දක ඇති අතර පුරවැසියන්ගේ යෝජනා සහ කමිටුවේ නිර්දේශ වශයෙන් ඒවා ඉදිරිපත් කර ඇත. ජාතික කොඩිය, ජතික ගීය, ආගම, රාජ්‍ය ක්‍රමය, රාජ්‍ය පාලන ක්‍රමය කුමන ආකාරයක් විය යුතුය යන සාකච්ඡාව අන්තර්ගත වී ඇත. කාන්තා අයිතීන් හා කාන්තා නියෝජනය පිළඹඳව අනතර්ගතව ඇත. මේ කාරණා පිළිබඳ කමිටු සාමාජිකයින්ගේ ද මතභේද ඇත.

ආගම සම්බන්ධයෙන් කමිටුව නිර්දේශ හතරක් ඉදිරිපත් කර ඇති අතර මේ කාරණා පිළිබඳ ව මහජනයාගේ පොදු මතයක් අනුව ව්‍යවස්ථාව සකස් කළ යුතු ය. ඒ සඳහා මහජන සංවාදයක් ඇති කිරීම වැදගත් ය. ඒකීය රජයක් පිළිබඳ වැඩිපර සාකච්ඡා කර ඇති අතර සන්ධීය ක්‍රමයක් පිළිබඳ සාකච්ඡාව මේ ඔස්සේ ගොඩ නැගීම ද සිදුවිය යුතු ය.

පාර්ලිමේන්තුව, විධායකය, නීති පද්ධතිය, පාළාත් සාභාව, පාළාත් පාලන ආයතන යනාදී යාන්ත්‍රණයන් පිළිබඳ තීරණය කිරීමට අවසන් අයිතිය ඇත්තේ මහජනතාවට ය. පරමාධිපත්‍ය බලය වන්නේ එයයි. එකී පරමාධිපත්‍ය හිමි නම් පමණි, සැබෑ ලාංකිකයෙක් බවට පත් වන්නේ. ලෝකයේ ඇති බොහෝ පාලන ක්‍රම පිළිබඳව මෙහි

සාකච්ඡා කර ඇති අතර එය පුරවැසියන්ට වඩාත් උචිත කාරණයකි. ඊට අමතරව මූලික අයිතිවාසිකම් පිළිබඳ ඉතා හොඳ යෝජනා ඇතුළත්ව ඇති අතර ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කෙසේ ඇතුළත් වේවිදැයි සිතිය යුතු ය. ආරම්භයක් හැටියට මෙම සංවාදය, ඉතා හොඳ අවස්ථාවකි.





# අධිනීතිඥ ලාල් විජේනායක

මෙහිදීනව **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව** වෙනුවෙන් එහි සභාපති ධුරය හෙබ වූ අධිනීතිඥ ලාල් විජේනායක මහතා අදහස් පළ කළේ ය. ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය සහ මෙහෙයුම් කාරක සභාව තවමත් මෙම කෙටුම්පතේ ඇතැම් කාරණා සම්බන්ධයෙන් නිශ්චිත එකඟතාවයකට පැමිණ නොමැති බවත්, තවම සාකච්ඡා කරන බවත් එම නිසා මෙම කෙටුම්පත පිළිබඳ  සාකච්ඡාව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය වන තුරු ඉදිරියට ගෙන යා යුතු බවත්, ඔහු සඳහන් කළේ ය. මෙම කමිටු වාර්තාව පිළිබඳ සමාජයේ සාකච්ඡා වීමේ වැදගත් කම ද එතුමන් අවධාරණය කළේ ය.

එසේ ම මහජන අදහස් විමසීමේ කමිටුවේ ක්‍රියාකාරීත්වය, ඔවුන් දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රිකකයට ගොස් මහාජන අදහස් හා යෝජනා ලබා ගත් ආකාරය සහ ඒවා පිළිබඳ අධ්‍යයනය කරමින් සාකච්ඡා කරමින් නිර්දේශය සකස් කිරීමේ වැඩපිළිවෙල පිළිබඳව ද අදහස් පළ කළේ ය. එහිදී අතැම් කරුණු පිළිබඳ පොදු මතයකට එළඹීමට නොහැකි වූ බවත් ඒ නිසා වැඩි දෙනාගේ මතයට ඉඩ දුන් බව ද පකාශ කළේ ය. එසේ ම සමස්ථයක් වශයෙන් ජනතා අපේක්ෂාවන් මොනවාදැයි කමිටු ක්‍රියාකාරීත්වයේ දී ලැබුණු අත්දැකීම් ඇසුරෙන් ඔහු කරුණු පැහැදිලි කළේ ය.

පසුගිය අත්දැකීම් අනුව මෙරට ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණයෙන් ම බිඳ වැටී ඇතැයි ජනතාව විස්වාස කරන බවත් ඒ නිසා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙනුවෙන් ජනතාව දෑස් දල්වා බලා සිටින බවත් විජේනායක මහතා සඳහන් කළේ ය.

මෙරට ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සහ ජාතික සංහිඳියාව ඇති කිරීම ඇතුළු ජනතාවගේ අපේක්ෂාවන් පිළබඳ අදහස් දක් වූ විජේනායක මහතා ජනතා අදහස් ඇසුරෙන් කමිටු වාර්තාවට අන්තර්ගත කළ නිර්දේශ පිළිබඳ යම් විග්‍රහයක් කළේ ය. අතැම් කරුණු කෙරෙහි සියලු කමිටු සාමාජිකයින්ට පොදු එකඟතාවක් ඇතිවිය නොහැකි වුණත් මූලික අයිතිවාසිකම් ඇතුළු සමානාත්ම තාවය පිළිබඳ කමිටුව සිටින්නේ එකම අදහසක බව ද ඔහු කිවේ ය.

මේ ආදි වශයෙන් කමිටු ක්‍රියාකාරිත්වය සහ අත්දැකීම් අභියෝග පිළිබඳව ද ඔහු අදහස් දක් වුවේ ය.